# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,858 — 1969 ජූනි 13 වැනි සිකුරාද — 1969.6.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් .. .. .. | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම .. .. | 75 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම .. .. .. | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම .. .. .. | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන .. | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම .. .. .. | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම .. | — | නොතාරිස් ලැයිස්තුව .. .. .. | |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම .. .. | — | විවිධ දැන්වීම .. .. .. | |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම .. .. | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### දකුණු පලාත

#### මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය

වැලිගම, සොමි ගුණරත්න මහත්මිය ..............පැමිණිලිකාරයා.

නොම්මරය : ඇම්. ඇස්. 73 එදිරිව

තෙලිජ්ජවිල කුමාරදාස වත්තේ, කුමාර් කරුණානායක..........

.......................................................... විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් හිමිකම් කියන් නඩු හානියක් නොවන පරිදි, ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 7,024.21 ක් සහ 65.11 දින සිට රු. 6,776.88 ට තීති පොලියද අයකර ගැනීම පිණිස වර්ෂ 1969 ක් වූ ජූලි මස 19 දින පෙරවරු 10.30 ට මාතර පිස්කල් කාර්යාලය අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කේ හොරගොඩ යන ගමේ පිහිටි අක්කර 15, රූඩ් 3, පර්චස් 18.75 ක් විශාලත්වය ඇති උතුරෙන් : වි.පි. 5757 ද, වි.පි. 4393 පේන පල්ලෙවෙල කුඹුරද, නැගෙනහිරට : වී. පි. 208784 පේන පොල්පට්ටියෙගේ නද, මෙම ඉඩමේ ලොට් 2 දරණ කැබැල්ලද, දකුණට : කොම්පිලමුල්ල කුඹුරද, වී.පි. 150110 සහ 119476 පේප ඉඩමද, බස්නාහිරට : කුමාරදාස වත්තද, වී.පි. 134862 සහ 213925 න් ද මායිම් වූ වැකඩවත්තේ බෙදාවෙන් කරන ලද ඒකාබද්ධ ලොට් 1, 3 සහ 4 යන ඉඩම්වල ගහකොල පලතුරු සමග බිමද, කුරුඳුවැවිල්ලද වේ.

2. ඉහත කී හොරගොඩ පිහිටි අක්කර 0, රූඩ් 3, පර්චස් 35.6 ක් විශාලත්වය ඇති උතුරෙන් : මීගහකුඹුරේ ලොට් 2 දරණ කැබැල්ලද, නැගෙනහිරින් : කිතුල්වායෙ රාජ සන්තක කැලේද, දොලේ දෙනියද, දකුණෙන් : ආණ්ඩුවේ කැලේද, බස්නාහිරින් : මෙම ඉඩමේ ලොට් 1 දරණ කැබැල්ලෙන්ද, මායිම් වූ මීගහකුඹුරේ බෙදාවෙන් කරන ලද කැබැල්ලෙන් බෙදාවෙන් කරපු ඒකාබද්ධ ලොට් 2 සහ 3 දරණ කැබැලිවල සම්පූර්ණ ගහකොල, පලතුරු සමග බිම,

3. ඉහත කී හොරගොඩ පිහිටි විකුරුණි 24ක් වපසරිය ඇති උතුරෙන් : මිදෙල්ල ගහ ලියද්ද ද, නල්ලවලේ වත්තෙන්ද, නැගෙනහිරින් : පුවක් කුඹුර සහ ආණ්ඩුවට අයිති ගොඩ ඉවුරද, දකුණට : මාරඹගෙ වත්ත සහ මාරඹහෙ දෙනියෙන්ද, බස්නාහිරට : ගල්පොත්තෙන්ද, මායිම් වූ පිටමුල්ලේ කුඹුර සම්පූර්ණයෙන්,

4. ඉහත කී හොරගොඩ පිහිටි වීමළු දෙකක් වපසරිය ඇති උතුරෙන් : සහ නැගෙනහිරින් : තුන්දොලේ ගේනද, දකුණට : තල් ගස් දෙනියද, බස්නාහිරින් : වෙරළුගහදෙනියෙන්ද, මායිම් වූ තල් ගස්දෙනිය සම්පූර්ණයෙන්,

5. ඉහත කී හොරගොඩ පිහිටි වීපැල දෙකක් වපසරිය ඇති උතුරෙන් : දන්කනත්තෙ වත්තද, නැගෙනහිරින් : මගලියකුඹුර නොහොත් අගලීයද, දකුණෙන් : ඇල්ගේනෙදෙනිය වත්තෙන්ද, බස්නාහිරින් : කොස්හෙනෙ වත්ත නොහොත් පැඟිරිවත්තෙන්ද, මායිම් වූ මගලියදෙනිය නොහොත් ඇල්හේනෙ දෙනිය සම්පූර්ණයෙන්ද,

6. එකී හොරගොඩ පිහිටි අක්කර 3, පර්චස් 10ක්, විශාලත්වය ඇති උතුරෙන් : අවරිය වත්තද, නැගෙනහිරින් : ඌරුගෙට දෙනිය සහ ගම්සභා කොම්පි පාරද, දකුණෙන් : ඇල්හේනෙ දෙනිය නොහොත් ගනේකුඹුරද, බස්නාහිරින් : ආණ්ඩුව සන්තක ඉඩම නොහොත් සැමීඩේල් ගෘප් ද, යන මායිම්තුල පිහිටි දන්කනත්තෙ වත්ත නොහොත් මැගලීය වත්ත සම්පූර්ණයෙන්ද,

7. එකී හොරගොඩ පිහිටි පැල දෙකක් වපසරිය ඇති, උතුරෙන් : නල්ගහ පිට්ටනියද, නැගෙනහිරින් : ඉහල වත්තද, දකුණෙන් : වැව ද, බස්නාහිරින් : අඹගහමුල්ලෙ වත්තද, මායිම් වූ අඹගහමුල්ලෙ නැමති කුඹුර සම්පූර්ණයෙන්,

8. ඕ. 691/107 පොතේ රිජිස්ටර් කරපු අක්කර 29, රූඩ් 1, පර්චස් 20 ක් විශාලත්වය ඇති එකී හොරගොඩ පිහිටි, උතුරෙන් : ගම්මු අයිතිවාසිකම් කියන ඉඩමද, දොලපාර සහ වී. පි. 5757 ලොට් "ඇම්" 533 ද, නැගෙනහිරින් : වී.පි. 208783 ද, දකුණෙන් : වී.පි. 213920 සහ ගම්මු අයිතිකම් කියන ඉඩමද, බස්නාහිරින් : ගම්මු අයිතිකම් කියන ඉඩමෙන්ද, මායිම් වූ පැඟිරිගේන නැමති ඉඩමේ සියළු පලතුරු සහ බිමද, තේ වැවිල්ල සම්පූර්ණයෙන්ද, පැක්ටේරියද, එහි තිබෙන සියළුම උපකරණ ආදිය සහ සියළුම ගොඩනැගිලිද වේ.

මැ. ග. වින්සන්ට්
මාතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්‍ෂ 1969 ක්වූ ජූනි මස 2 වැනි දින මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

6-411

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.


75—B 69343—5,728 (69/6)

## මාතර දිස්ත්‍රික් නඩුශාලාවේදීය

කඹුරුගමුවේ, ඇස්. පී. ඒ. ද සිල්වා .................. පැමිණිලිකාරයා.

නොම්මරය : එල්. 1758 එදිරිව

මිරිස්ස, උතුරේ, ආර්. ඩබ්. කරොංචි අප්පු ............ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ ජූලි මස 8 දින පස්වරු 2ට එම ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේ සියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ මිරිස්සේ පිහිටි පතික්කලගෙ වත්තේ බෙදා වෙන් කළ නැගෙනහිර දෙකෙන් පංගු කැබැල්ලට මායිම්, උතුරට : ජේම්ස් සෝනාරත්න මිළයට ගත් ආණ්ඩුවේ ඉඩමද, නැගෙනහිරට : ගොරොක්ගහ වත්තද, දකුණට : කුරුඳුගේන ද, බස්නාහිරට : පතික්කලගෙ වත්තේ අනික් කැබැල්ලද යන මෙහි තුළ රූඩ් 2 ක් පමණ විශාල ඉඩමේ සියළු ගහකොල, පලතුරු සමග බිම සහ සියළු ම ගොඩනැගිලි ද වේ.

මැ. ග. වින්සන්ට්,
මාතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1969 ක්වූ මැයි මස 28 වැනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

6-418

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| **ජූනි** | 69. 6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69. 6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| **ජූලි** | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| **අගෝස්තු** | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| **සැප්තැම්බර්** | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| **ඔක්තෝබර්** | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| **නොවැම්බර්** | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| **දෙසැම්බර්** | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි